“මිනිසුන්ගෙන් තමන් ආවරණය කරන යම් වස්තුවක් ඉදිරියේ ඔබ අතුරින් කෙනෙකු සලාතය ඉටු කරන විටක, ඒ අතරින් කෙනෙකු හරහට යෑමට සිතුවේ නම් ඔහු ව වැළැක්විය යුතුය. එයට ඔහු පිටුපෑවේ නම් ඔහු සමග සටන් වැදිය යුතුය. සැබැවින්ම ඔහු ෂෙයිතානුවෙකි.”

අබූ සඊද් අල්-කුද්රී -රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී. මෙය මර්ෆූඃ
ගණයට අයත් හදීසයකි.“මිනිසුන්ගෙන් තමන් ආවරණය කරන යම් වස්තුවක් ඉදිරියේ ඔබ අතුරින් කෙනෙකු සලාතය ඉටු කරන විටක, ඒ අතරින් කෙනෙකු හරහට යෑමට සිතුවේ නම් ඔහු ව වැළැක්විය යුතුය. එයට ඔහු පිටුපෑවේ නම් ඔහු සමග සටන් වැදිය යුතුය. සැබැවින්ම ඔහු ෂෙයිතානුවෙකි.”
[පූර්ව සාධක සහිත හදීසයකි] [බුහාරි හා මුස්ලිම් හි වාර්තා වී ඇත]

සියලුම කටයුතුවලදී ප්රවේසම හා ස්ථාවරත්වය පිළිපදින මෙන් දහම නියෝග කරයි. මෙලොව හා ආගමික කටයුතුවලින් වඩාත් වැදගත්ම කරුණ වනුයේ සලාතයයි. එහෙයින් ඒ ගැන අවදානයෙන් කටයුතු කරන මෙන් ද ඒ සඳහා සුත්රා හෙවත් බාධා තිරයක් තබා ගන්නා මෙන්ද දහම දිරි ගන්වා ඇත. සලාතය ඉටු කරන්නා මිනිසුන්ගෙන් තමන් ආවරණය වන පරිදි එසේ සුත්රාවක් භාවිත කිරීම හේතුවෙන් තමන් ඉදිරියේ ඔවුන් ගමන් කිරීමෙන් වළක්වාලිය හැක. එය තම සලාතයේ අඩුවක් ඇති නොකරයි. තම පරමාධිපති සමග සම්බන්ධතාව ඉදිරියට ගෙන යා හැකිය. තමන් අතරින් හරහට ගමන් කරන්නට යමෙකු සිතූ විට ඉතා පහසු ක්රමය භාවිත කරමින් වැළැක්විය යුතුය. පහසු අයුරින් වළක්වා ඔහු එයින් නොවැළකුනේ නම් සැබැවින්ම ඔහු එහි ගරුත්වය කෙළෙසා ඇත. ඔහු සීමාව ඉක්මවා කටයුතු කර ඇත. එවිට සතුරා වැළැක්වීමේ ක්රියා මාර්ගය වනුයේ තම අතින් ඔහුව වළක්වා අරගල කිරීමය. හේතුව සැබැවින් එම ක්රියාව ෂෙයිතානුන්ගේ ක්රියාදාමවලින් වූවකි. ඔවුහු ජනයා නැමදුම් කෙළසීමටත් ඔවුන්ගේ සලාතයේ ව්යාකූලත්වය ඇති කිරීමටත් මාන බලමින් සිටිති.

https://sunnah.global/hadeeth/si/show/3098